කැලණිය අධ්‍යාපන කලාපය

දෙවනවාර පරීක්ෂණය - 2016

බුද්ධ ධර්මය - II

ශ්‍රේණිය 10 කාලය පැය 02 යි.

* පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. (i) සිදුහත් බෝසතාණෝ මුහුණදුන් අභියෝග 2 ක් නම්කරන්න.

(ii) මහාසංඝරත්නය මනා වූ පිළිවෙත් පුරනු ලබයි. එම අදහස පැවසෙන සඝ ගුණය කුමක්ද?

(iii) සමථ භාවනාවෙන් ලැබිය හැකි ප්‍රතිඵල 2 ක් නම්කරන්න.

(iv) පැවිදි වූ දා සිටම පිණ්ඩපාතයෙන් යැපුන, ගමින් ගමට වඩිමින් අසරණයනට පිහිට වූ සසුන්කෙත සරුකළ ලාංකේය භික්ෂු යතිවරයාණෝ කවරහුද?

(v) "අචරිත්වා බ්‍රහ්මචරියං" යන ගාථාවට අනුව මහළු වියේදී දුක් නොවන්න නම් තුරුණු වියේදී කළයුත්තේ කුමක්ද?

(vi) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භෝග විනාශයට හේතුවන කරුණු අතුරින් 2 ක් ලියන්න.

(vii) සිව්වනක් පිරිස නම් කරන්න.

(viii) පද්මාකාර ජීවිතය යනු කුමක්ද ?

(ix) බහු ජාතික හා බහු ආගමික සමාජයක සහජීවනයෙන් කටයුතු කිරීමට මගපෙන්වන බෞද්ධ ඉගැන්වීම් 02 ක් ලියන්න.

(x) "යථාපි මූලේ අනුපද්දවේ දල්හේ

ඡින්නෝපි රුක්ඛො පුනරේව රූහති.... යන ගාථාව සම්පූර්ණ කරන්න.

02. (i) පංචනීවරණ ධර්ම අතුරින් දෙකක් නම් කරන්න.

(ii) "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා" යන්නෙහි සිංහල අදහස ලියන්න.

(iii) දෛනික ජීවිතයට සමථ භාවනාවෙන් ලද හැකි ප්‍රයෝජන කෙබඳු දැයි කරුණු තුනක්වත් පදනම් කරගෙන විස්තර කරන්න.

03. (i) සීලය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) පන්සිල් පදපහ අතුරින් එක් සිල් පදයක් ගෙන එය විරමණය හා සමාදානය යන දෙඅංශයට වැටෙන අයුරු පහදන්න.

(iii) සිල් රැකීමෙන් වන අනුසස් 5 අතුරින් දෙකක් ගෙන ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල්වන අයුරු විස්තර කරන්න.

04. (i) සබඳතා රකින මිනිස් යුතුකම් හඳුන්වා දෙන සූත්‍ර දේශනාව කුමක්ද ?

(ii) දරුවන්ගෙන් දෙමව්පියන්ට විය යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) යුතුකම් ඉටුකිරීම තුළින් පුද්ගල දියුණුව සේම සමාජ දියුණුවද ඇතිවන අයුරු ගුරු සිසු සබඳතාවය තුළින් පැහැදිලි කරන්න.

05. (i) "මහණෙනි මම චේතනාවම කර්මය යයි කියමි." යනුවෙන් අදහස පවසන බුදුරජාණන්වහන්සේ දේශනා කළ පාලි පාඨය කුමක්ද ?

(ii) තුන්දොර නම්කර ඒ ඒ දොරටුවෙන් සිදුවන කුසල කර්ම 1 බැගින් ලියන්න.

(iii) "අකුසලයෙන් වැලකී කුසලයෙහි යෙදීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කරගත හැකිය." යන කියමන පැහැදිලි කරන්න.

06. (i) ආර්ය සත්‍යය අතුරින් දෙකක් නම් කරන්න.

(ii) ඔබ නම්කළ සත්‍යයන් අතුරින් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) තමන්ට මුහුණ දීමට සිදු වූ ගැටළුවක් චතුරාර්ය සත්‍යය නම් වූ න්‍යාය උපයෝගී කරගෙන විසඳාගත් අයුරු නිදසුනක් ගෙන පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහනක් ලියන්න

(i) අනගාරික ධර්මපාලතුමා

(ii) ධම්ම පදය

(iii) විපස්සනා භාවනාව

(iv) කර්මය